**ශ්‍රී ලංකා චෙස් සම්මේලනය - 2019**

------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය ව්‍යාචනය

ශ්‍රී ලංකා චෙස් සම්මේලනයේ (“සම්මේලනයේ”) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් විසින් මට සහාය වන ලදී.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | බැංකු ශේෂය | 12,619,676 | බැංකු ශේෂ තහවුරු කිරීම් | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ජංගම වත්කම් සහ වත්මන් වගකීම් සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි සැපයිය යුතුය. |
| (ආ) | සුළු මුදල් | 750 | ශේෂ තහවුරු කිරීම් | -එම- | |
| (ඇ) | ණය ගැතියන් | 56,000 | ශේෂ තහවුරු කිරීම් සහ පසුකාලීන බේරුම්කරණයන් | -එම- | |
| (ඈ) | ලැබිය යුතු ගිණුම් | 210,000 | පසුකාලීන බේරුම්කරණ විස්තර | -එම- | |
| (ඉ) | ගෙවිය යුතු ගිණුම් | 331,000 | පසුකාලීන බේරුම්කරණ විස්තර සහ ශේෂය තහවුරු කිරීම | -එම- | |
| (ඊ) | ආදායම් | 22,684,920 | රිසිට්පත් සහ බැංකු පත්‍ර | -එම- | ආදායම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි සැපයිය යුතුය |

### 1.5.2 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1993 අංක 47 දරණ ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වැනි වගන්තිය මගින් 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ 21 වැනි වගන්තියට කරන ලද සංශෝධනයේ 2 වැනි වගන්තියට අනුව එම ක්‍රීඩා පනතේ III පරිච්ඡේදය යටතේ ලියාපදිංචි සෑම සංගමයක්ම සෑම වසරකම දෙසැම්බර් 31 වන දිනට එහි පොත් නඩත්තු කර සමතුලිත කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. ඉහත පනතේ 3 වැනි වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් 2019 වර්ෂය සඳහා වන සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන සැලකිය යුතු ප්‍රමාදයකින් යුතුව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. | සම්මේලනයේ 2019 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සැලකිය යුතු ප්‍රමාදයකින් යුතුව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සම්මේලනය සෑම වසරකම මූල්‍ය ප්‍රකාශන නඩත්තු කර සකස් කළ යුතු අතර ක්‍රීඩා පනතේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 18,895,561 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,478,458 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,417,103ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු ආදායම් රු. 34,723,161කින් වැඩිවීම මෙම වර්ධනයට හේතුවිය.